# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,854 - 2014 මාර්තු මස 14 වැනි සිකුරාදා - 2014.03.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 366 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 366 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 368 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 373 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අප්‍රේල් මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මාර්තු මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

365- B 80820 - 2,890 (2014/03)
B4 –

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ආනයනයන් පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂකවරුන් පත්කරගැනීම සඳහා වන ප්‍රසම්පාදනය**

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ආනයනයන් පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂකවරුන් පත්කරගැනීම සඳහා නැව් භාණ්ඩ පරීක්ෂා කිරීමෙහි යෙදෙන පිළිගත් ආයතන වෙතින් කොළඹ 10, ඕල්කොට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන), සභාපති විසින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. ආපසු ගෙවනු නොලබන රු. 2,500 ක ලිපිලේඛන ගාස්තුවක් හෝ එයට සමාන වටිනාකමින් යුත් පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදල් වර්ගයකින් ගෙවීමෙන් අනතුරුව 2014.04.01 වැනි දින ප. ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ ශ්‍රී ලංකා දූත කාර්යාල වලින් ලබාගත හැකි ආකෘති පත්‍රවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

03. ලංසු භාරගැනීම 2014.04.02 වැනි දින ප. ව. 2.00 (ශ්‍රී ලංකා වේලවෙන්) ට අවසාන කෙරේ.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මූලස්ථානයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණ සිටින ලෙස ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනැවිත් භාරදීමට කටයුතු කළ යුතුයි.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ශ්‍රී ලංකා දුම්රිය මූලස්ථානය,
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. ලංසු ලිපිලේඛන, ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි අතර වැඩි විස්තර පහත සඳහන් අය වෙතින් ලබාගත හැක.

දුම්රිය ගබඩා අධිකාරී,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2438078 හෝ 2436818
ෆැක්ස් අංකය : 2432044.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7116

03- 337

---

# බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - වලස්මුල්ල**

අධිකරණයේ නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වලස්මුල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවරුණු නඩු වලින් රාජසන්තක කරන ලද සහ අයිතිකරුවන් අයිතිය තහවුරු නොකරන ලද පහත සඳහන් භාණ්ඩ 2014.04.26 වැනි දින පෙ. ව. 9.00 සිට මෙම අධිකරණ භූමියේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. මෙම නඩු භාණ්ඩ සම්බන්ධයෙන් අයිතිය කියා සිටින යම් තැනැත්තෙකු වේ නම් ප්‍රසිද්ධ වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම අයිතිය පිළිබඳ වූ ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය.

2. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම මහජනතාවට නඩු භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

3. අපේක්ෂිත මිල ඉල්ලීමක් ඉදිරිපත් නොවන ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කිරීමට අධිකරණයට බලය ඇත.

4. භාණ්ඩ මිලදී ගත් වහාම අදාළ මුදල ගෙවා අධිකරණ සංකීර්ණයෙන් ඉවත් කර ගත යුතුයි. ගෙවීම සඳහා චෙක්පත් මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

5. නඩු භාණ්ඩ මිලදී ගන්නා අය තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි.

උදේශ් රණතුංග,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
වලස්මුල්ල.

2014 පෙබරවාරි මස 11 වැනි දින,
වලස්මුල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 9611 | අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය |
| 02. | 8835 | අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය |
| 03. | 18892 | සීෆෑන් අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය |
| 04. | 24968 | අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය |
| 05. | 13411 | අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය |
| 06. | 16621 | අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය |
| 07. | 99320 | අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය |
| 08. | 8044 | අංක 113-1117 දරන රතුපාට තැපැල් 90 යතුරු පැදිය |
| 09. | 6937 | 103 ශ්‍රී 5989 දරන යමහා වර්ගයේ යතුරුපැදිය |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 10. | AR 770/12 | අංක SPTD 8897 දරන බජාජ් ප්ලැටිනා යතුරුපැදිය |
| 11. | AR 305/12 | අංක NWHA 8518 දරන ලොන්සින් යතුරුපැදිය |
| 12. | AR 304/12 | අංක SP 151- 6192 හොණ්ඩා ට්‍රේල් වර්ගයේ යතුරුපැදිය |
| 13. | BR 88/01 | අංක 92 ශ්‍රී 1848 දරන යතුරුපැදිය |
| 14. | AR 667/12 | මෝටර් පුල් වර්ගයේ යතුරුපැදිය |
| 15. | AR 768/12 | අංක 145-8107 දරන ජාලිං වර්ගයේ යතුරු පැදිය |
| 16. | AR 721/10 | අංක 123 -6662 ට්‍රේල් වර්ගයේ යතුරු පැදිය |
| 17. | 1593 | අංක 112-9279 දරන යතුරුපැදිය |
| 18. | AR 171/13 | අංක SPGW 9989 දරන යතුරු පැදිය |
| 19. | 9197 | අංක 135 - 1126 දරන යතුරු පැදිය<br>අංක SPGZ 9465 දරන යතුරු පැදිය |
| 20. | 22992 | සීග්‍රා වර්ගයේ යතුරුපැදිය |
| 21. | AR 726/12 | රූලේ වර්ගයේ කාන්තා පා පැදිය |
| 22. | AR 338/12 | පාපැදිය |
| 23. | 26474 | ඊටෙල් වර්ගයේ ජංගම දුරකථනය |
| 24. | 26545 | මයික්‍රොමැක්ස් වර්ගයේ ජංගම දුරකථනය |
| 25. | 26459 | බ්ලූ වර්ගයේ ජංගම දුරකථනය |
| 26. | 25944 | සෝනි එරික්ෂන් වර්ගයේ ජංගම දුරකථනය |
| 27. | AR 519/12 | නොකියා වර්ගයේ ජංගම දුරකථනය<br>සැම්සුන් වර්ගයේ ජංගම දුරකථනය |
| 28. | 25711 | ෆෝම් වර්ගයේ ජංගම දුරකථනය |
| 29. | 26025 | KZG වර්ගයේ ජංගම දුරකථනය |
| 30. | 25710 | සෝනි එරික්ෂන් වර්ගයේ ජංගම දුරකථනය |
| 31. | 25644 | Bird වර්ගයේ ජංගම දුරකථනය |
| 32. | 26072 | ඩිජිටල් මොබයිල් වර්ගයේ ජංගම දුරකථනය |
| 33. | 26086 | VI Fone වර්ගයේ ජංගම දුරකථනය |
| 34. | 26323 | ජංගම දුරකතනය |
| 35. | 27690 | බල්බ් 01 හෝල්ඩර් 01 වයර් අඩි 160ක් අඩංගු රෝල් 06 |
| 36. | 13411 | අත් පොරව |
| 37. | AR 17/13 | අඩි 05ක් පමණ උස කළුපාට ගෑස් සිලින්ඩරය හා අඩි 24ක් පමණ දිග ගෑස් කටරය සහිත රබර් බට 02 |
| 38. | AR 668/12 | රතුපාට බාස්කට් 01 |
| 39. | AR 663/12 | සුදු පැහැති නයිලෝන් ලනු 01 |
| 40. | AR 666/12 | පොරව 01 යකඩ ඉණි 01 |
| 41. | AR 643/12 | අලවංගු 01 |
| 42. | 27296 | ලේන්සුව |
| 43. | 27297 | ළදරු පාවහන් යුගල |
| 44. | 1594 | ඇලුමිනියම් මුට්ටිය |
| 45. | 21405 | ක්ලච් කේබල් 01 |
| 46. | 26477 | ඇලුමිනියම් මුට්ටිය |
| 47. | 20181 | ආරෝපණය කළ හැකි විදුලි පන්දම |
| 48. | 23831 | චීත්ත 1/2 m |
| 49. | 18662 | පවර් පැක් 01 |
| 50. | 96971 | බහුකාර්ය ලී වැඩ යන්ත්‍රය |
| 51. | 25769 | ඇලුමිනියම් මුට්ටිය |
| 52. | 25987 | කුඩා පනිට්ටුව |
| 53. | 94208 | උදැල්ල |
| 54. | BR 410/08 | මන්නා පිහි 01 |
| 55. | 16053 | අඟලේ බෙන්ඩ් 01 |
| 56. | 16253 | ආරෝපණය කළහැකි විදුලි පන්දම |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 57. | 22253 | ක්ලච් කේබල් 01 |
| 58. | 20180 | ආරෝපණය කළ හැකි විදුලි පන්දම |
| 59. | 20187 | ක්ලච් කේබල් 01 |
| 60. | 25429 | ළදරු පාවහන් යුගල |
| 61. | 16237 | අඟලේ බෙන්ඩ් 01 |
| 62. | 25184 | පනිට්ටුව |
| 63. | 96420 | ගෑස් සිලින්ඩරය, ගෑස් ලිප, රෙගුලේටරය සහ වයරය |
| 64. | 89191 | පොරව 01 |
| 65. | 25931 | 1 kg පඩි 01, යකඩ තරාදි 01, පොරව 01, පිහි 02 |
| 66. | 95261 | ගස් කපන මැෂින් 01 |
| 67. | 99319 | බන්ඩි කියත් 01 |
| 68. | 26190 | ඇලුමිනියම් මුට්ටිය 01, ප්ලාස්ටික් ජෝගු 01 |
| 69. | AR 213/13 | තඹ කම්බි 4k 900g යි |
| 70. | 16924 | මැටි මුට්ටි 01 |
| 71. | 22103 | ප්ලාස්ටික් තාච්චි 01, වේවැල් කූඩ 01, උදලු 01, සවල් 02 |
| 72. | 27933 | වයර් |
| 73. | BR 560/13 | පිහි 04 |
| 74. | 24495 | ප්ලාස්ටික් බාල්දි 01, (බාස්කට්) |
| 75. | 25986 | පොරව 01, මන්නා පිහි 01 |
| 76. | 27698 | බාස්කට් 01 |
| 77. | 24494 | ප්ලාස්ටික් බාල්දි 01 (බාස්කට්) |
| 78. | 20174 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 79. | AR 621/12 | බාල්දි 01 (බාස්කට්) |
| 80. | AR 622/12 | බාල්දි 01 |
| 81. | 25843 | යතුරුපැදි අමතර කොටස් |
| 82. | 27755 | පිත්තල පියන සහිත පාත්තර 01, ඇලුමිනියම් හැන්ද, කළුපාට පාත්තර 01, කොළ පාට ප්ලාස්ටික් වට්ටි 01, වටාපත් 01, රබර් මූඩි සහිත කුඩා කුප්පි තොගයක් |
| 83. | 17591 (AR 128/11) | දිරාගිය බුරුත කදන් තොගයක් (දර සඳහා) |
| 84. | 28547 | ෆෝන් චාජරය |
| 85. | 28557 | සුදු වයර් මීටර් 09ක්<br>හෝල්ඩරයක්<br>බල්බයක්<br>සොකට් අවුට්ලට් එකක් |
| 86. | 28558 | විවිධ විදුලි වයර් යුගල මීටර් 26ක් හෝල්ඩරයක් බල්බයක් |
| 87. | 28409 | වීදුරු බෝතල් හා වීදුරු කැබලි |
| 88. | 28747 | ජල කරාම 01 |
| 89. | 28748 | ජල කරාම 01 |
| 90. | 28804 | ඇලුමිනියම් මුට්ටිය |
| 91. | අංක රහිත | බැරල් තොගය |
| 92. | අංක රහිත | ප්ලාස්ටික් බූලි තොගයක් |
| 93. | අංක රහිත | හෝස්බට කැබලි තොගයක් |
| 94. | අංක රහිත | ලොකු බෝතල් තොගයක් |
| 95. | අංක රහිත | භාගේ (1/2) බෝතල් තොගයක් |
| 96. | අංක රහිත | කාලේ (1/4) බෝතල් තොගයක් |

03-230

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (01) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඒ ඇන්ඩ් බී මාර්කටිං (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 93853
සංස්ථාගත කළ දිනය : 2013.07.31
ලියාපදිංචි ලිපිනය : අංක 240/1, කිඹුලාපිටිය පාර, අක්කර පනහ, මීගමුව
සමාගම් ලේකම් : පොත්නාගේ දිලුම් උදයංග ප්‍රනාන්දු.

03-245

## ප්‍රසිද්ධ දැනුම්දීමයි

පෞද්ගලික සමාගමේ තත්ත්වය වෙනස්වීම සම්බන්ධව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ට්‍රයිකෝ ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී. 62911
සමාගමේ නව තත්ත්වය : ට්‍රයිකෝ ලොජිස්ටික්ස් ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ක්‍රෝලි මැනේජ්මන්ට් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

03-254

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාර, පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබූ බව මෙයින් දන්වා සිටිමි.

සමාගමේ නම : මානව සවිය නිපුණතා සංවර්ධන හා අධ්‍යාපන (ගරන්ටි) ලිමිටඩ්
සමාගමේ අංකය : පී එල් 2062
ලියාපදිංචි කාර්යාලය : අංක 16, පරණ කැස්බෑව පාර, ගංගොඩවිල, නුගේගොඩ.

03-304

## නිවේදනයයි

එච් එන් බී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් 2014 ජනවාරි මස 30 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගමේ පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : එච්එන්බී ජෙනරල් ඉන්ෂුරන්ස් ලිමිටඩ්
සමාගමේ අංකය : පී. බී. 5167
ලියාපදිංචි කාර්යාලය : අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ශිරෝමි ෂාමේන් හල්ලොලුව,
ලේකම්.

03-306

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2014 පෙබරවාරි මස 20 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සදර්න් ලංකා ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 97148
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 115 A/1, තලපත්පිටිය පාර, උඩහමුල්ල, නුගේගොඩ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස්
(පුද්ගලික) සමාගම.

03-307/1

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2014 පෙබරවාරි මස 19 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : පී ඇන්ඩ් ඩබ්ලිව් ට්‍රේඩිං ලංකා (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 97114
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 72/70, සානි ගුණවර්ධන මාවත, කැනල් පාර, හැඳල, වත්තල

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස්
(පුද්ගලික) සමාගම.

03-307/2

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2014 පෙබරවාරි මස 19 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ඩිසයින් රිපබ්ලික් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 97113
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 78, ස්ට්‍රැෆර්ඩ් පෙදෙස, කොළඹ 06

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස්
(පුද්ගලික) සමාගම.

03-307/3

## මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (2) වැනි වගන්තිය ප්‍රකාර ඒකාබද්ධ කිරීම

සීමාසහිත LOLC සර්විසස් (පුද්ගලික) සමාගමේ පී බී 3821 පීවී සහ ("LOSL") සහ සීමාසහිත LOLC මයික්‍රො ඉන්වෙස්ට්මන්ට් සීමිත සමාගමේ - පී බී 4686 ("LOMI") අධ්‍යක්ෂ මණ්ඩල, LOSL LOMI සමග ඒකාබද්ධ කිරීමට 2007 අංක 7 දරන සමාගම් පනතේ - 242 (2) වගන්තියට අනුකූලව තීරණය කරන ලදී.

මෙම ඒකාබද්ධ කිරීමේ කොන්දේසිවලට අනුව සියලුම "LOSL" කොටස් ගෙවීමකින් හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවකින් තොරව අවලංගු කෙරෙන අතර, LOSL සියලු වත්කම් හා වගකීම් LOMI වෙත පවරාගනු ලැබේ. LOMI අඛණ්ඩව ක්‍රියාත්මක වන සමාගම වෙයි. LOMI හි වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය පවරාගැනීමෙන් පසු ඒකාබද්ධ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස කටයුතු කරනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ක්‍රිෂාන්ති එම්මානුවෙල් මෙනවිය,
සමාගම් ලේකම්.

2014 පෙබරවාරි මස 11 වැනි දින.

03-308

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ක්ලැසික් වෝටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 92591
ලියාපදිංචි කළ දිනය : 2013.05.17
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 15, ජලනල මාවත, පින්නරාව, බදුල්ල.

අධ්‍යක්ෂක අණ පරිදි.

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

03-318

---

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : තරංගා ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි අංකය : පී. වී. 96411
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 244, කොළඹ පාර, වැහැර, වඳුරාගල, කුරුණෑගල
සමාගම ලියාපදිංචි කළ දිනය : 2014.01.16

03-319/1

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : ෂෙයාර් ලංකා ඔරිජිනල් (පීවීටී) එල්. ටී. ඩී.
සමාගම ලියාපදිංචි අංකය : පී. වී. 97082
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 56/03 ඒ/08, ප්‍රයිම් රෙසිඩන්සීස්, ශාන්ත ජෙඩිස් මාවත, මහබාගේ, රාගම, ශ්‍රී ලංකා
සමාගම ලියාපදිංචි කළ දිනය : 2014.02.17

03-319/2

---

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : ගැජට්ස් විජට්ස් (පීවීටී) එල්. ටී. ඩී.
සමාගම ලියාපදිංචි අංකය : පී වී 97172
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 7 2/9, බාර්න්ස් රෙසිඩන්සීස්, බාර්න්ස් පෙදෙස, කොළඹ 07
සමාගම ලියාපදිංචි කළ දිනය : 2014.02.20

03-319/3

---

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : වතු ග්‍රැෆික්ස් (පීවීටී) එල්. ටී. ඩී.
සමාගම ලියාපදිංචි අංකය : පී වී 97122
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 40, කොළොන්නාව පාර, කොළොන්නාව
සමාගම ලියාපදිංචි කළ දිනය : 2014.02.19

03-319/4

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

පන්නිපිටිය, රුක්මල්වත්ත, අංක සී 29/22 හි පදිංචි ප්‍රීති ග්‍රේස් බියගම ලේකම්ගේ වන මම මහජනයාට දන්වා සිටින වගනම්, පිළියන්දල, බෝකුන්දර, 3 වැනි පටුමග, සඳකිරණ මාවත, අංක 122 හි පදිංචි ශ්‍රීලත් ජෝසප් පෙරේරා යන අයට බලය පවරන ලද ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. කාරියවසම් විසින් ලියා සහතික කරන ලද අංක 171 හා 2014.01.26 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය වර්ෂ 2014 ක් වූ පෙබරවාරි මස 24 වැනි දින සිට අවලංගු සහ බලරහිත වන බව ද, ඔහු විසින් ඇතුලත්වනු ලබන කිසිදු ගණුදෙනුවක බලපැවැත්මක් නොමැති බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ප්‍රීති ග්‍රේස් බියගම ලේකම්ගේ.

03-333

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

මතුගම, මද්දෙගෙදර පාර, අංක 181/3 ලිපිනයෙහි පදිංචි විතානගේ දෝන ගෞරි වන මා එකී ලිපිනයෙහි පදිංචි කදනගේ ජයසීලි හේමලතා වෙත බලතල පවරමින්, ප්‍රසිද්ධ නොතාරිස් ජී. එස්. හපුහෙට්ටි මහත්මිය විසින් ලියා සහතික කරන ලද 2013.01.17 දිනැති අංක 1509 දරන ඇටෝර්නි බලපත්‍රය 2014.02.24 වැනි දින සිට අවලංගු කරන බව සියලු දෙනා වෙත මෙයින් දැනුම් දෙමි.

විතානගේ දෝන ගෞරි.

03-334

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ලාෆ්ස් ලයිෆ් කෙයා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2014.01.03
සමාගමේ අංකය : පී වී 96353
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

නීතිඥ කීර්ති පතිරාජ,
සමාගම් ලේකම්.

03-260

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ලාෆ්ස් ටර්මිනල්ස් ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2013.12.05
සමාගමේ අංකය : පී. බී. 5156
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

නීතිඥ කීර්ති පතිරාජ,
සමාගම් ලේකම්.

03-261

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : සප්නා රෙක්රූට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 96417
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 555/2/බී 3, කඩුවෙල පාර, තලංගම උතුර, බත්තරමුල්ල
සංස්ථාගත කළ දිනය : 2014.01.09

සමාගමේ ලේකම්.

03-265

## 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ කෙරෙන ප්‍රසිද්ධ දැන්වීමයි

සමාගමේ නාමය : ෆයිනෙස්ට් සොෆ්ට්වෙයාර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 97073
ලියාපදිංචි ලිපිනය : අංක 270/1 ජී. කෙරවලපිටිය, හැඳල, වත්තල

සමාගම් ලේකම්.

03-266

## ඇටර්නි බලය අවලංගු කිරීම

කල්කුඩා හි වාලච්චේනායි පාරේ පදිංචි (දෙදෙනාම), අමරසිංහම් අරුල් පුනිද වලරාජන් මහතා සහ එලිසබෙත් ප්‍රපාජිනි මහත්මිය වන අප විසින් කල්කුඩා හි, වාලච්චේනායි පාරේ, අංක 281 හි පදිංචි ටී. කේ. වික්ටර් ජෙයරූබන් මහතා වෙත ප්‍රදානය කරන ලද ඔඩ්ඩමාවාඩිහි ප්‍රසිද්ධ නොතාරිස් එම්. බී. එම් හුසේන් විසින් ලියා සහතික කරන ලද අංක 9186 හා 2013.06.23 දාතම දරන ඇටර්නි බලය, මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කර අවලංගු කරන ලද බැව් මෙයින් දන්වා සිටිමු.

අමරසිංහම් අරුල් පුනිද වලරාජන්
එලිසබෙත් ප්‍රපාජිනි.

03-268

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : දූරේක්ෂා රබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 97070
ලියාපදිංචි ලිපිනය : අංක 66/6, යක්කල පාර, බණ්ඩාරවත්ත, ගම්පහ
සංස්ථාගත කළ දිනය : 2014 පෙබරවාරි මස 17 වැනි දින.

සමාගමේ අධ්‍යක්ෂ.

03-270

### ප්‍රසිද්ධ දැන්වීම

සීමාසහිත සමාගමක් ලියාපදිංචි කිරීම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි ඡේදය ප්‍රකාරව කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ඒෂියා ගෲප් ඇන්ඩ් රුවිසියා ඇඩ්වර්ටයිසිං (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 96732
ලියාපදිංචි දිනය : 2014 ජනවාරි 28
ලියාපදිංචි ලිපිනය : 408 සී, හයිලෙවල් පාර, පන්නිපිටිය

ආර්. එස්. බෝමලුවගේ,
සමාගම් ලේකම්.

2014 පෙබරවාරි මස 17 වැනි දින.

03-271

---

### ලීලා හාඩ්වෙයාර් (පුද්ගලික) සමාගම

සමාගම විසුරුවා හැරීමේ අවසාන රැස්වීම

**2007 අංක 07 දරන සමාගම් පනතේ 331 (2) වගන්තිය යටතේ දැනුම් දීමයි**

සමාගම ඈවර කිරීමේ සහ දේපළ විකිණීමේ ක්‍රියාවලිය සිදුකළ ආකාරය සම්බන්ධයෙන් වන විස්තර ලබාගැනීමත් ඒ සම්බන්ධයෙන් වන ඕනෑම පැහැදිලි කිරීමක් ඈවරකරු ලවා සිදුකර ගැනීමත්, සමාගමේ ගිණුම්, පොත් පත් සහ ලේඛන යනාදිය පියවා දැමීම සම්බන්ධයෙන් වන විශේෂ යෝජනාවක් සම්මත කර ගැනීම සහ ඈවරකරු ඔහුගේ වගකීමෙන් නිදහස් කිරීමත් යන කාරණා සඳහා වන සමාගමේ සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක් 2014 මාර්තු මස 27 වැනි දින සවස 3.30 ට අංක 2 ඒ 1/1, රංජන් පාර, දුම්රියපොළ පාරෙන් හැරී, කොළඹ 06 යන ස්ථානයේ පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එසේ ම සාමාජිකයා නියෝජනය කරමින් ඔහු වෙනුවට රැස්වීමට සහභාගි වීම සහ ඡන්දය ප්‍රකාශ කිරීමට පෙරකලාසිකරුවෙකු හෝ පෙරකලාසිකරුවන් පත් කිරීමට සාමාජිකයන්ට ඇති ව්‍යවස්ථාපිත අයිතිය පිලිබඳව මෙයින් දැනුම් දෙන අතර, එම පෙරකලාසිකරු හෝ පෙරකලාසිකරුවන් සමාගමේ සාමාජිකයන් වීම අත්‍යවශ්‍ය නොවන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. පී. ගජේන්ද්‍ර,
ඈවරකරු.

2014 පෙබරවාරි මස 24 වැනි දින.

03-289

---

### මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2013 දෙසැම්බර් මස 13 වැනිදා ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : Marist Distributors (Pvt.) Ltd
සමාගමේ අංකය : පී. වී. 96044
ලියාපදිංචි කාර්යාලය : අංක 17/12, අර්නස්ට් පෙදෙස, ලුනාව, මොරටුව.

ටීස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ්
සෙක්රටරීස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්.

අංක 2 ඒ 1/1, රංජන් පාර,
දුම්රියපොළ පාරෙන් හැරී,
කොළඹ 06.

03-290/1

---

### මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2013 දෙසැම්බර් මස 11 වැනිදා ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : Proitzen (Pvt.) Ltd
සමාගමේ අංකය : පී. වී. 95996
ලියාපදිංචි කාර්යාලය : අංක 144/2-3 පළමු හරස් වීදිය, කොළඹ 11.

ටීස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ්
සෙක්රටරීස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්.

අංක 2 ඒ 1/1, රංජන් පාර,
දුම්රියපොළ පාරෙන් හැරී,
කොළඹ 06.

03-290/2

---

### මහජනතාව වෙත කෙරෙන විශේෂ නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ (5) වැනි වගන්තිය අනුව ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට දැනුම් දීමයි.

සමාගමේ නම : ටෙලෙබේ ඉංජිනියරිං සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 81740
සමාගමේ ලිපිනය : අංක 327, කඩවත පාර, රාගම.

03-295

### දැන්වීමයි

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

රත්නපුර, ගැටන්ගම, අංක 235 දරන ස්ථානයේ පදිංචි ලංකා හලුගේ කමලාවතී (ජාතික හැඳුනුම්පත් අංකය 56 699 1934 V) වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් බී. එල්. අබේරත්න ප්‍රසිද්ධ නොතාරිස් මහතා 2002.02.05 වැනි දින සහතික කරන ලද අංක 3396 දරන ඇටෝර්නි බලපත්‍රය ම ගින් රත්නපුර ගැටන්ගම අංක 235 හි පදිංචි රෝහාන් ඩයස් ස්ටීවන් යන අය වෙත ප්‍රදානය කරන ලද ඇටෝර්නි බලය 2014.01.25 වැනි දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු පුරවැසියන් වෙත කරනු ලබන දැන්වීමයි.

මින් ඉදිරියට මා වෙනුවෙන් රෝහාන් ඩයස් ස්ටීවන් යන අය පෙනී සිටින කිසියම් හෝ ක්‍රියාවකට මා බැඳී නොසිටින බව ද මා මෙයින් දන්වා සිටිමි.

ලංකා හලුගේ කමලාවතී.

2014 ජනවාරි මස 25 වැනි දින.

03-296

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ඔප්ටිකල් ඕනර්ස් ඕගර්නයිසේෂන් ඇපයෙන් සීමිත සමාගමක් ලෙස 2012 ජූලි මස 19 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ඔප්ටිකල් ඕනර්ස් ඕගර්නයිසේෂන්
සමාගම් අංකය : ජී ඒ 2724
ලියාපදිංචි ලිපිනය : අංක 62, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, බොරැල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071 8244 495 , 077 8197041

03-343

---

### දැන්වීමයි

මෙම දැන්වීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමකි.

සමාගමේ නම : ක්වික් ටෝටල් ඔටෝසර්විසස් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි ලිපිනය : අංක 3 C/106, මත්තෙගොඩ, මත්තෙගොඩ
සමාගමේ ලියාපදිංචි අංකය : PV 83641
සංස්ථාගත කළ දිනය : 2012.01.11

ලේකම්.

03-346

### ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

පේරාදෙනිය, ක්‍රිස්ටෝපර් පාර, අංක 123/A හි පදිංචි දයානන්ද හෙට්ටිආරච්චි වන මම, කිත්සිරි නිමල් උඩවත්ත ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2005 ක් වූ ජූලි මස 28 වැනි දින ලියා සහතික කරන ලද අංක 501 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර අහෝසි කරන බවත්, මින් මතු එකී ඇටෝර්නි බලපත්‍රය කිසිදු නීත්‍යානුකූල වගකීමක් නොදරන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් සාමාන්‍ය ජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

දයානන්ද හෙට්ටිආරච්චි.

03-350

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ෆුට්වර්ක් ඉන්ටර්නැෂනල් ඩාන්ස් ඕර්ගනයිසේෂන් ප්‍රයිවට් ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2014.02.24
සමාගමේ අංකය : පී වී 97223
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 955/5 A 3, රෝයල් ගාඩින්ස්, රාජගිරිය

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග පරිදි,

සමාගම් ලේකම්.

03-351

---

### විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

රාජගිරිය, පාර්ක් පාරේ අංක 36 හි පදිංචි නානායක්කාර පන්ඩි කෝරාලලාගේ ලක්ෂමන් නානායක්කාර වන මම සාමාන්‍ය ජනතාව වෙත කරන ලද දැනුම් දීමයි.

ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. එම්. ඒ. එල්. සී. මුහන්දිරම්ගේ විසින් සහතික කරන ලද අංක 22 2/09/2010 දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මත මාගේ ඇටර්නි බලකරු ලෙස කොළඹ 10 මරදාන 2 වන පටුමග සුගතවංශ මාවතේ අංක 5/2 හි පදිංචි නාමල් ජවානන් ද සිල්වා පත්කරනු ලැබූ අතර මෙතෙන් පටන් එම පත්කිරීම අවලංගු කරන බව ද ඔහුට මා වෙනුවෙන් කිසිදු ඔප්පු සහ බැංකු කටයුත්තක් කිරීමට නොහැකි බවද මෙසේ දැනුම් දෙමි.

03-354

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

1. ණය යොමු අංකය : 70258293, පැටිකිරිගේ ගුණසීල මහතා සහ පැටිකිරිගේ නිලංගා නයනහාරි ගුණසීල මහත්මියට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

2. ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013.09.06 වැනි දිනැති අංක 1827 දරන ගැසට් පත්‍රයේ හා 2013 අගෝස්තු මස 26 සඳුදා දින ඩේලිනිවුස්, තිනකරන් හා දිනමිණ යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2014.04.08 වැනි දින පෙ. ව. 11.00 ට කොළඹ 05, හැව්ලොක්පාරේ, අංක 290 හි පදිංචි ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, උඩුගහපත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවේ වෙනිවැල්කොළ ග්‍රාමයේ පිහිටි ඊරියගහඕවිට හෙවත් කැබැල්ලගහඕවිට හෙවත් නාකනඉන්නෙඕවිට හෙවත් හැලඹගහඕවිට නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි ගහකොළ සහ සියලු දේ ඇතුළත් ව බලයලත් මිනින්දෝරු සිරිබෝපෙආරච්චි විසින් සාදන ලද 2007 නොවැම්බර් මස 22 දිනැති අංක 4742 දරන පිඹුරෙහි ලොට් X ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට: ඒ. කේ. කොරනිස් සිඥෙඤෝ සහ වෙනත් අය සහ ඩී. වීරක්කොඩි උරුමකම් කියන ඉඩම් ද, පාර සහ අංක 4352 දරන පිඹුරෙහි ලොට් 1 A ද, නැගෙනහිරට : පාර (මහා මාර්ගය) සහ නැසී ගිය ජෙම්ස් වීරසිංහගේ උරුමකරුවන් සහ වෙනත් අය උරුමකම් කියන ඉඩම සහ පිඹුරු අංක 4352 හි ලොට් 1 A ද, දකුණට : නැසීගිය ජෙම්ස් වීරසිංහගේ උරුමකරුවන් සහ වෙනත් අය උරුමකම් කියන ඉඩම සහ කුඹුරේ සිට ප්‍රධාන පාර දක්වා වූ පාරද, බස්නාහිරට : ඩබ්. ඒ. ඕබීස් සහ වෙනත් අය ද, ඩී. වීරක්කොඩි ද උරුමකම් කියන ඉඩම් ද, මායිම්ව අංක 4742 දරන පිඹුරට අනුව අක්කර එකයි රූඩ් එකයි පර්චස් තිස් අටයි දශම බිංදුවයි හතක (අ. 1, රූ. 1, පර්. 38.07) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම හයයි බිංදුවයි දෙකයි එකයි හතක (හෙ. 0.60217) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

එකී ඉඩම පහත විස්තර කර ඇති ඉඩම් ඒකාබද්ධ කිරීමකි.

(1) එකී වෙනිවැල්කොළ පිහිටි නාකනඉන්නෙඕවිට හෙවත් හැලඹගහඕවිට නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි ගහකොළ සහ වෙනත් සියලු දේ ද ඇතුළත් ව බලයලත් මිනින්දෝරු එස්. බොපෙආරච්චි විසින් සාදන ලද 2005 ඔක්තෝබර් මස 02 දිනැති අංක 4221 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3, උතුරට : ලොට් 2 ඉඩම, ඩී. වීරක්කොඩි උරුමකම් කියන ඉඩම ද, නැගෙනහිරට : ජෙම්ස් වීරක්කොඩිගේ උරුමකරුවන්ගේ සහ වෙනත් අයගේ ඉඩම ද, දකුණට: පාර ද, බස්නාහිරට : එම්. ඒ. ඕබීස් හා වෙනත් අයගේ ඉඩම් ද, මායිම්ව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 138/147 හි ලියාපදිංචි කර ඇති එකී අංක 4221 දරන පිඹුරට අනුව අක්කර එකයි, රූඩ් එකයි පර්චස් දහයයි දශම බිංදුවයි එකක (අ. 1, රූ. 1, පර්. 10.01) නොහොත් හෙක්ටයාර බිංදුවයි දශම පහයි තුනයි එකයි දෙකයි දෙකක (හෙක්. 0.53122) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

(2) එකී වෙනිවැල්කොළ පිහිටි ඊරියගහඕවිට හෙවත් කැබැල්ලගහඕවිට නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි ගහකොළ සහ වෙනත් සියලු දේ ද ඇතුළත් ව බලයලත් මිනින්දෝරු එස්. බෝපෙආරච්චි විසින් සාදන ලද 2006 අප්‍රේල් මස 15 දිනැති අංක 4352 දරන පිඹුරෙහි ලොට් 1 B ලෙස දක්වා සීමා නිර්ණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 B, උතුරට : ලොට් 1 Aද, නැගෙනහිරට : පාර (මහා මාර්ගය) ද, දකුණට : පිඹුරු අංක 4221 හි ලොට් 3 ද, මායිම්ව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 382/156 හි ලියාපදිංචි කර ඇති අංක 4221 දරන පිඹුරට අනුව පර්චස් දහ නවයයි දශම නවයයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 19.90) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. පීලිපොත,
කළමනාකරු.

ලංකා බැංකුව,
පිළියන්දල.

03-341

---

## පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළෙහි කල්ගත නොවූ වසර 70 ක බදු අයිතිය වර්ෂ 2014ක් වූ අප්‍රේල් මස 04 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, (කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත) කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ මරදාන වෝඩ් 25 පංචිකාවත්ත හි පිහිටි ශ්‍රී සංඝරාජ මාවත වරිපනම් අංක 14 සහ මරදාන පාර වරිපනම් අංක 79 හි පිහිටි පරිශ්‍රය වන එකී

ලොට් 1 ඉඩම සමග ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ සහ සියල්ලම ඇතුලුව ඒවායේ බදුකර අයිතිය වේ.

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1097/37 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත. (බිම් ප්‍රමාණය අ. 0 රූ. 0 පර්. 12.08)

සංජය සේදර සෙනරත් සහ කලහෙ පණ්ඩිකෝරලගේ අරුණි මංජුලා කරුණාගොඩ විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එස්. එන්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2012.02.08 දිනැති අංක 4881 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.02.28 වැනි දින ඩේයිලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් සහ එදින *ගැසට් පත* ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* .- මරදානේ, කාර්මික විද්‍යාල මංසන්ධියේ මෙම දේපළ පිහිටා ඇති අතර, ශ්‍රී සංඝරාජ මාවත සහ මරදාන පාර ඔස්සේ ප්‍රවේශ මාර්ගය භාවිතා කෙරේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ද (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු ප්‍රධානී නීති, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී ප්‍රධාන කාර්යාලය, අංක 450 ගාලු පාර, කොළඹ 03.

*දුරකථන අංක* : 2565573/2565565.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 011-2873656, 0777-672082,
ෆැක්ස් අංකය : 011-2871184.

03-352

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය.

**මඩකළපුවේ තාළන්කුඩා හි පිහිටි අ. 3 රූ. 01, පර්. 20ක් විශාලැති අගනා දේපළක්**

(1) නැගෙනහිර පළාතේ, මඩකළපු දිස්ත්‍රික්කයේ මන්මුනායි පත්තුවේ තාලන්කුඩා මන්මුනායිපති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තාළන්කුඩා 153 ග්‍රාමසේවක වසම තුළ කාළන්කුඩා ගමේ පිහිටි පිඹුරු අංක බීටී 869 නගර සභා සීමාව තුළ වූ කාත්තන්කුඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෝඩ් අංක 08 නව කාත්තන්කුඩි ග්‍රාමයේ කර්බලා පාරේ පිහිටි වරිපනම් අංක 30 දරන PP මඩ/1182 හි ලොට් අංක 03 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස.

එහි පිහිටි වෙනත් සියලු අයිතීන් ද, ඇතුළු වේ. ඉහත සඳහන් ගොඩනැගිලිවලට ස්ථිර ලෙසම සවිකර ඇති හෝ අමුණා ඇති සහ/හෝ ඉදිරියේ දී සවිකළ හැකි හෝ ඇමණිය හැකි සෑම සහ සියලු නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, සවිකිරීම්, ඇමුණුම් සහ සේවාවන් ඇතුලු වන අතර, ජලය සැපයීමේ පද්ධති උපකරණ, පණිවිඩ හුවමාරු උපකරණ සහ අධිශීතකරණ උපකරණ ආදිය ද ඇතුළු වේ.

වර්ෂ 2014ක් වූ මාර්තු මස 28 වැනි දින ඉහත සඳහන් දේපළ ප. ව. 12.15 ට දේපළ පිහිටි ස්ථානයන්හි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨ විය හැකි මාර්ගය*.- මඩකලපුව නගරයේ (නැගෙනහිර වෛද්‍ය පීඨ මංසන්ධිය) අසළ සිට තාලන්කුඩා සමෘද්ධි බැංකු මංසන්ධිය දක්වා කල්මුනේ පාරේ කි. මී. 10.3ක් පමණ ගමන්කර වමට හැරී කුඩා මංසන්ධියක් දක්වා ඇන්තනිස් පාරේ මීටර් 200ක් පමණ ගමන් කර නැවතත් වමට හැරී තවත් මීටර් 350ක් පමණ ගමන් කිරීමෙන් මෙම දේපළට ළඟාවිය හැකි ය.

(2) මඩකලපුවේ කරුවප්පන්කර්නි නව මායිම් පාරේ පිහිටි වරිපනම් අංක 98/2 දරන පරිශ්‍රයේ පිහිටි අ. 0 රූ. 0 පර්. 13.76 ක් විශාලැති අගනා දේපළක්.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනායි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩකලපුව මහ නගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 13 කරුවප්පන්කර්නි 176 B ග්‍රාමසේවක වසම තුළ කරුවප්පන්කර්නි ගමේ නව මායිම් පාරේ පිහිටි පිඹුරු අංක 2008/1216 දරන බෙදාවෙන් කළ ඉඩම් කොටස.

එහි පිහිටි වෙනත් සියලු අයිතින් ද ඇතුළු වේ. ඉහත සඳහන් ගොඩනැගිලිවලට ස්ථිර ලෙසම සවිකර ඇති හෝ අමුණා ඇති සහ හෝ ඉදිරියේ දී සවි කළ හැකි හෝ ඇමිණිය හැකි සෑම සහ සියලු නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ සවිකිරීම් ඇමුණුම් සහ සේවාවන් ඇතුලු වන අතර, ජලය සැපයීමේ පද්ධති උපකරණ, පණිවිඩ හුවමාරු උපකරණ සහ අධිශීතකරණ උපකරණ ආදිය ද ඇතුලුව වේ.

වර්ෂ 2014ක් වූ මාර්තු මස 28 වැනිදින ප. ව. 12.45 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨ විය හැකි මාර්ගය* .- මඩකලපුවේ ප්‍රසිද්ධ බස් නැවතුම් පලේ සිට ත්‍රිකුණාමල පාරේ කි. මී. 3ක් පමණ කොත්තු කුලන්ති මාරි අම්මාන් කෝවිල දක්වා ගමන් කර, දකුණට හැරී, මායිම් පාරේ කි. මී. 1.2ක් පමණ ඉදිරියට ගොස් දකුණට හැරී වේලායුදම් පටුමගේ

මීටර් 25ක් පමණ ගමන් කිරීමෙන් පාරේ වම් පසින් පිහිටි මෙම දේපළ හමුවේ.

(3) මඩකලපුවේ කලවන්චිකුඩි හි පිහිටි 82 1/2' x 52 1/2' ක් විශාලැති අගනා දේපළක්,

නැගෙනහිර පළාතේ, මඩකලපු දිස්ත්‍රික්කයේ මන්මුනායි ඉරුමිල් පත්තුවේ පාලම් තොට්ටමනමන් 116 A ග්‍රාමසේවක වසම තුළ කළවන්චිකුඩි ගමේ පිහිටි පදිරිප්පු තොට්ටම් නොහොත් ඊස්ටර්න් සිටර්න් පළයාතොට්ටම් යන නමින් හඳුන්වන ඉඩමෙන් බෙදා වෙන් කළ ඉඩම් කොටස.

මෙය එහි පිහිටි වෙනත් සියලු අයිතීන් ද ඇතුළු වේ. ඉහත සඳහන් ගොඩනැගිලිවලට ස්ථිර ලෙසම සවිකර ඇති හෝ අමුණා ඇති සහ/හෝ ඉදිරියේ දී සවිකළ හැකි හෝ ඇමිණිය හැකි සෑම සහ සියලු නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, සවිකිරීම්, ඇමුණුම් සහ සේවාවන් ඇතුලු වන අතර, ජලය සැපයීමේ පද්ධති උපකරණ, පණිවුඩ හුවමාරු උපකරණ සහ අධිශීතකරණ උපකරණ ආදිය ද ඇතුලු වේ.

ඉහත සඳහන් දේපළ වර්ෂ 2014 ක් වූ මාර්තු මස 28 වැනි දින ප. ව. 1.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨ විය හැකි මාර්ගය* .- මඩකලපුව පොලිස් ස්ථානයේ සිට කල්මුණේ පාරේ මීටර් 30ක් පමණ පීපල්ස් ලීසිං සමාගම් ගොඩනැගිල්ල දක්වා ගමන් කර එතැනින් වමට හැරී කෙටි දුරක් වමට ඇති 2 වැනි පාර දක්වා ගමන්කර මෙම පාරේ දකුණුපසින් පිහිටි පරිශ්‍රය වේ.

(4) මඩකලපුවේ කළවන්චිකුඩි පිහිටි පදිරිප්පු හන්දියේ පිහිටි අම්පාල් ෆාම් හවුස් යන පරිශ්‍රයේ ගබඩාකර හෝ තබා ඇති නැගෙනහිර පළාතේ, මඩකලපු දිස්ත්‍රික්කයේ, පදිරිප්පු හන්දියේ පිහිටා ඇති අම්පාල් ෆාම් හවුස් යන පරිශ්‍රයේ ගබඩාකර හෝ තබා ඇති ණයට ගන්නන්ට අයත් ව්‍යාපාර බඩු තොග (Stock - in -Trade) ලෙස හඳුන්වනු ලබන සියලුම උපකරණ සහ සෑම සහ සියලු පොහොර තොග ඉහත පරිශ්‍රයේ තබා ඇති සම්පූර්ණ ව්‍යාපාර බඩු තොග (Stock -in -Trade)

වර්ෂ 2014ක් වූ මාර්තු මස 28 වැනි දින ප. ව. 1.15 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨ විය හැකි මාර්ගය.* - මඩකලපුව පොලිස් ස්ථානයේ සිට කල්මුණේ පාරේ කළවංචිකුඩි මූලික රෝහල පසුකර මීටර් කිහිපයක් ගමන් කිරීමෙන් මෙම පාරේ දකුණුපසින් පිහිටි මෙම දේපළට ළඟාවිය හැකි ය.

වර්ෂ 2013 අගෝස්තු මස 12 වැනි දින සහතික කරන ලද අංක 742 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සන්තිරපිල්ලේයි සුතාහරන් සහ විජයමාලිනී සුතාහරන් විසින් (ණයට ගන්නන්) හැටියට පැහැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ ඉහත කී පිළිවෙලින් වෙන්දේසි කරනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2014.02.22 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, ද අයිලන්ඩ්, දිවයින යන පුවත්පත් සහ තිනකුරල් ද බලන්න.

සෑම වෙන්දේසියක් ම අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතු ය: (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, සහ වැට් බද්ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000ක් ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

ව්‍යාපාර බඩු තොග වෙන්දේසිය අවසානයේ දී සෑම ගැණුම්කරුවෙක් ම මිටිය පහත හෙලූ විගස (1) සම්පූර්ණ ගැණුම් මුදල සහ (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, සහ වැට් බද්ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000 ක් ද, වෙන්දේසිකරු වෙත ගෙවිය යුතු ය.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02 නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි නීති කළමනාකරු අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 2448448, 011 7448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක 2873656, 0777- 672082 ෆැක්ස් 2871184.

03-342

---

### සෙලාන් බැන්ක් පී. එල්. සී. - ඩිවලොප්මන්ට් බැන්කිං යුනිට් ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහරගම නගර සභා සීමාවන් තුළ පරණ පාර කොට්ටාව විහාර මාවත කොතලාවල දැන් වැලිවිට පිහිටි දබුගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එල්. එස්. ජී. ප්‍රනාන්දු විසින් 2004.09.10 වැනි දින සාදන ලද අංක 328 පිඹුරේ නිරූපිත 2 බී දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි නිවාස දරන ගොඩනැගිලි ඇතුළු සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 30.8

එල්. එස්. ජී. ප්‍රනාන්දු විසින් 1976.08.19 වැනි දින අංක 432 දරන පිඹුරේ නිරූපිත ලොට් 14 සහ ලොට් 15 දරන ඉඩම් උඩින් හා දිගේ මාර්ග අයිතිය ද සමග.

මෙම දේපළ රාජගිරිය පදිංචි හෙට්ටිආරච්චිගේ ජයතිලක යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම*.- මහරගම නගර මධ්‍යයේ සිට හයිලෙවල් මාර්ගයේ කොට්ටාව දෙසට කි. මී. 2.5ක් පමණ මහල්වරාව හන්දිය දක්වා ගමන් ගන්න. මෙහි දී වමට හැරී හරස් පාරට පිවිස මී. 50ක් පමණ ගමන්කර දකුණට හැරී පරණ කොට්ටාව පාරට පිවිස මීටර් 150ක් පමණ ගිය පසු

වම් පසින් මෙත්සිරි පෙදෙස හමුවේ. මෙම පාරේ මීටර් 50ක් පමණ ගමන් ගත් විට අදාළ දේපළට ලඟාවිය හැක.

2014 ක් වූ අප්‍රේල් මස 01 වැනි දින ප.ව. 1.00 ට ඉහත විස්තර කර ඇති නිශ්චල දේපළ මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2011.12.30 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේද* 2011.12.22 වැනි දින ඩේලිමිරර්, ලංකාදීප සහ 2012.02.16 වැනි දින තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුලු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමණාකාරිනී (නීති),සෙලාන් බැන්ක් පී. එල්. සී., සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456487/011-2456471.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක :071-4755974/071-8446374/077-7761706.
දුරකථන අංක/ෆැක්ස් : 081-2210595

03-367

---

**ඩී එෆ් සී සී බැංකුව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වන වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 1577 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැව්ගම්පත්තු උතුරේ, උහන ග්‍රාමයේ පිහිටි, කොටගමවත්ත සහ සියඹලාගහවත්ත හෙවත් ජුලියාඩ්වලව් ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු කේ. ජී. අමරදේව විසින් සාදන ලද 2003 අප්‍රේල් මස 24 වැනි දිනැති අංක 837 දරන පිඹුරේ ලොට් අංක 03 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 38.8
එහි පිහිටි සියල්ල සමග අම්පාර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැව්ගම්පත්තු උතුරේ උහන ග්‍රාමයේ පිහිටි, කොටගමවත්ත සහ සියඹලාගහවත්ත හෙවත් ජුලියාඩ්වලව් ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු කේ. ජී. අමරදේව විසින් සාදන ලද 2003 අප්‍රේල් මස 24 වැනි දිනැති අංක 837 දරන පිඹුරේ ලොට් අංක 05 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 4.4
එහි පිහිටි සියල්ල සමග අම්පාර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

**අංක 1578 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, මැදපළාත කෝරළේ, වැව්ගම්පත්තුවේ, උහන පිහිටි, කොටගමවත්ත සහ සියඹලාගහවත්ත හෙවත් ජුලියාඩ්වලව් ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු කේ. ජී. අමරදේව විසින් සාදන ලද 2003 අප්‍රේල් මස 24 වැනි දිනැති අංක 837 දරන පිඹුරේ ලොට් අංක 06 ලෙස දැක්වෙන බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 1, පර්. 14.3 එහි පිහිටි සියල්ල සහිතව

**අංක 1579 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, උහන කොට්ඨාසයේ වැව්ගම්පත්තු කෝරළේ උහන පිහිටි බෙදාවෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූ. 01, පර්. 30 එහි පිහිටි සියල්ල සහිතව.

ඉහත සඳහන් ඉඩම සහ පරිශ්‍රය 1999 අගෝස්තු මස 23 වැනි දිනැති, මිනින්දෝරු අධ්‍යක්ෂකවරයා විසින් සහතික කරන ලද උහන නගරයේ කැඩැස්තර සිතියම් අංක 280014 (පත්‍රිකා අංක 01) හි රොඩ්ඩුවලව් ලෙස දැක්වේ.

ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර් 0.1897
ඉහත කී 1/2 පිඹුරේ මෙම දේපළ ලොට් අංක 143 ලෙස දක්වා ඇත.

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. හෙන්නායක මැණිකේ විසින් සහතික කරන ලද, 2006 ඔක්තෝබර් මස 12 වැනි දිනැති අංක 1577, 1578, සහ 1579 දරන උකස්කරයන් ප්‍රකාර, උහන විශාකා රෙස්ටුරන්ට් නම් ව්‍යාපාරය පවත්වාගෙන යන උහන පදිංචි, හීනටිගල කනත්තගේ රංජිත් ප්‍රේමලාල් විසින් ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2014 අප්‍රේල් මස 02 වැනි දින (බදාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුලු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර),
4. රු. 120,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011-2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 122 ක සේවා විශිෂ්ඨත්වය සමගින්

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

03-317

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

එම්. එස්. පෙරේරා
ගිණුම් අංක : 0187 5000 0920

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2013.08.29 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් තුන් ලක්ෂ හතලිස් දෙදහස් පන්සිය දහ අටයි ශත තිස් හතක (රු. 5,342,518.37) මුදල ද, 2013 ජුනි 28 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් අට ලක්ෂ හතලිස් දෙදහස් හත්සිය හතයි ශත එකොළහක (රු. 4,842,707.11) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දාහතක් (17%) බැගින් වූ පොළිය ද, දැන්වීම ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2013.10.25 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2013.10.10 වැනි දින දිවයින තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2014.04.02 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උතුරු යටිකහ කෝරළේ කටුගම්පොල හත්පත්තුවේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කඹුරපොල පිහිටි "කඹුරපොල එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. අතපත්තු යන අය විසින් සාදන ලද 2011 නොවැම්බර් මස 26 දාතම හා අංක 280/2011 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එච්. එම්. ටිකිරිබණ්ඩා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම නැගෙනහිරට : කඹුරපොල මහා විද්‍යාලයේ ඉඩම දකුණට : අංක 681 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරටඃ කුලියාපිටියේ සිට හෙට්ටිපොල දක්වා ප්‍රධාන පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් අටක් (අ. 0 රූ. 1 පර්. 8) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමග එකී අංක 280/2011 දරන පිඹුරට අනුවය.

අංක 280/2011 දරන එකී පිඹුරේ නිරූපිත එකී ලොට් 1 වඩා නිවැරදිව පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී කඹුරපොල පිහිටි "කඹුරපොල එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. ඒ. එම්. සී. බණ්ඩාර යන අය විසින් සාදන ලද 1992 සැප්තැම්බර් මස 03 දාතම හා අංක 681 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එච්. එම්. ටිකිරිබණ්ඩා යන අය විසින් හිමිකිම් කියනු ලබන ඉඩම වෙන් කෙරෙන කම්බි වැට නැගෙනහිරට : කඹුරපොල මහා විද්‍යාලය වෙන් කෙරෙන කම්බි වැට දකුණට : අංක 681 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : කුලියාපිටියේ සිට හෙට්ටිපොල දක්වා ප්‍රධාන පාර වෙන් කෙරෙන කම්බි වැට යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් අටක් (අ. 0 රූ. 1 පර්. 8) විශාල ඉඩම් කොටස සමග සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 681 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව 99/36 යටතේ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

03-340/2

**සෙලාන් බැන්ක් පීඑල්සී - මහනුවර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ඉතා වටිනා ව්‍යාපාරික දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහනුවර මහ නගර සභා සීමාවන් තුළ කටුකැලේ සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ ව්‍යාපාරික කලාපය තුළ පිහිටි වරිපනම් අංක 541 සහ අංක 543 දරන පරිශ්‍රය බලයලත් මානක පී. එච්. ටී. ද සිල්වා විසින් සාදන ලද සහ 2011.05.25 වැනි දින අංක 2495 දරන සැලැස්මේ නිරූපිත ලොට් 1 දරන බෙදා වෙන් කර ඇති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 16.02 (හෙක්ටයාර් 0.04054)

මෙම දේපළ මහනුවර සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන කුසුම්සිරි සප්ලයර්ස් යන නාමය, විලාසය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන දඩල්ලගේ නන්දසිරි සිල්වා සහ කුමාරපති මොහොට්ටිලාගේ චිත්‍රා සිල්වා යන අය බන්ධනදායීන් වශයෙන් සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.-* මහනුවර නගර මධ්‍යයේ සිට පේරාදෙණිය පාර (සිරිමාවෝ බණ්ඩාරනායක මාවත) ඔස්සේ කි. මී. 1.5ක් පමණ ගමන් ගත් විට දකුණුපසින් හමුවන රීගල් සිනමාහල ඉදිරිපිටින් අදාළ දේපළ පිහිටා තිබේ.

2014ක් වූ මාර්තු මස 31 වැනි දින පෙ.ව. 11.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.12.13 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2013.11.21 ඩේලි මිරර්, ලංකාදීප සහ 2013.11.25 වැනි දින තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමණාකාරිනී (නීති),සෙලාන් බැන්ක් පීඑල්සී, සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456458/011-2456477/011-2456488.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක :071-4755974/071-8446374/077-7761706/081/2210595.

03-369

---

**සෙලාන් බැන්ක් පීඑල්සී - මහරගම ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඉතා වටිනා පදිංචියට/ව්‍යාපාරයකට සුදුසු දේපළක් දෙහිවල-ගල්කිස්ස නගර සභා සීමාවන් තුළ රත්මලාන ගමේ වකින්දාරාම පාරේ පිහිටි උස්වත්ත සහ සියඹලාගහ වත්ත සහ ඕවිට නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. එල්. විජයනායක විසින් 2006.01.26 වැනි දින මැන සාදන ලද 2391 දරන පිඹුරේ ලොට් X නමැති ඉඩම මැතක දී කරන ලද නැවත මැනුමකට හා අතුරු බෙදීමකට අනුව බලයලත් මානක කේ. ඩී. වෝල්ටර් පෙරේරා විසින් 2007.02.08 වැනි දින අංක 8/2007 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 1 සිට ලොට් 24 දක්වා පෙන්නුම් කර ඇති ඉඩම සහ R 1 සිට R 5 (පාර සඳහා වෙන් කිරීම) දක්වා පෙන්නුම් කරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි වකින්දාරාම පාර වරිපනම් 61 සහ 61/1 දරන දේපළ ඇතුළු අනෙකුත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : අ. 01 රූ. 02 පර්. 07.87ක් වේ.

ඉහත කී පිඹුරු අංක 2391 හි දැක්වෙන ලොට් X පහත විස්තර වන ඉඩම් කැබලි 03ක් ඒකාබද්ධ කොට මැන සාදන ලද්දකි.

1. බලයලත් මානක එම්. එස්. ටී. පී. සේනාධීර විසින් මැන සාදන ලද අංක 908 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 (රූඩ් 03, පර්. 0.7)

2. බලයලත් මානක එම්. එස්. ටී. පී. සේනාධීර විසින් මැන සාදන ලද අංක 908 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 (පර්. 1.7) දරන ඉඩම් කොටස් හා එහි තුළ පිහිටි වරිපනම් අංක 61 දරන ගොඩනැගිලි ඇතුලු සියලු දේ.

3. බලයලත් මානක ජී. බී. දොඩන්වල විසින් මැන සාදන ලද 2004.09.15 වැනි දින අංක 5069 පිඹුරේ නිරූපිත ලොට් 1 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි වරිපනම් අංක 61/1 දරන ගොඩනැගිල්ල ඇතුලු සියලු දේ. (රූඩ් 02 පර්.37.0).

ඉහත පිඹුරු අංක 008/2007 පිඹුරේ නිරූපිත ලොට් 12-14-19-20-21-22 දරන ඉඩම් කැබලි 06 හි පර්චස් 54.65 ක ඉඩම් ප්‍රමාණය අතහැර ඉතිරි

ඉඩම් කොටස් 18 එක් ඒකකයක් වශයෙන් විකුණනු ලැබේ. (ඉහත පිඹුරු අංක 008/2007 හි නිරූපිත පාරක් සඳහා වෙන්කර ඇති ලොට් ආර් 1 සිට ආර් 5 ඔස්සේ සහ දිගේ පාවිච්චි කිරීමේ සම්පූර්ණ අයිතිය ද සමග)

මෙම දේපළ ගල්කිස්ස සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන ලුම්බිණි ඇක්වේරියා ප්‍රයිවෙට් ලිමිටඩ් සහ නුගේගොඩ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන ලුම්බිණි ඇක්වේරියා වයඹ ලිමිටඩ් යන අය බන්ධනදායීන් වශයෙන් සෙලාන් බැංක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම.* - ගල්කිස්ස මංසන්දියේ සිට රත්මලාන දෙසට කිලෝමීටරයක් පමණ ගමන් ගෙන වම් දෙසට පිහිටි චකින්ද්‍රාරාම පාරට පිවිස මීටර් 350ක් පමණ ගමන් ගත් විට මෙම පාරේ වම් පසින් අදාළ දේපල පිහිටා තිබේ. (ලුම්බිණි ඇවනිව් මංසන්ධියේ සිට මීටර් 50ක් පමණ දුරින්

2014ක් වූ අප්‍රේල් මස 01 වැනි දින ප. ව. 3.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2011.06.03 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2011.05.09 සහ 2011.05.14 වැනි දින ඩේලි මිරර්, ලංකාදීප ද, 2011.05.20 සහ 2011.05.23 දින තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමණාකරු (නීති),සෙලාන් බැංක් පී. එල්. සී. සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456488/011-2456477/011-2456458.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව, මහනුවර,
දුරකථන අංක :071-4755974/071-8446374/077-7761706/081-2210595

03-370

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මාතලේ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සිව් මහල් නිවාස ගොඩනැගිල්ලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතලේ මහ නගර සභා සීමාවන් තුළ මාතලේ නගරයේ ගොඩපොල පාරේ පිහිටි පල්ලියලිවජියාර් වත්ත නොහොත් සියඹලාගහමුල වෙදරාලගේ වත්ත නමැති ඉඩමට

01. බලයලත් මානක කේ. කුමාරසාමි විසින් මැන සාදන ලද 1975.07.30 වැනි දින අංක 6031 පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද වරිපනම් අංක 22 දරන ඉඩම් කොටස හා සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 3.59

02. බලයලත් මානක කේ. සමරසිංහ විසින් මැන සාදන ලද 1993.04.21 වැනි දින අංක 1159 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කරන ලද ලොට් ඒ දරන වරිපනම් අංක 20 නමැති ඉඩම් කොටස හා සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය පර්චස් 3.40 (ඉඩමේ මුළු ප්‍රමාණය පර්චස් 6.99)

*දේපළට පිවිසීම.* - මාතලේ කෙලින් වීදියේ සිට ගොඩපොල පාරට පිවිස මීටර් 100ක් පමණ ගමන් ගත් විට මෙම පාරේ දකුණුපසින් පාරට මායිම්ව මුහන්දිරම් පාර මංසන්ධියට ඉදිරිපසින් අදාළ දේපළ පිහිටා තිබේ.

මෙම දේපළ මොහොමඩ් තජුඩීන් මොහොමඩ් ෆියාස් සහ මොහොමඩ් රවුෆ් නූර් ජෙසිමා නොහොත් සිත්ති ජෙසීමා යන අය බන්ධනදායීන් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2014 අප්‍රේල් මස 02 වැනි දින ප. ව. 3.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.04.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* 2013.04.30 වැනි දින ලක්බිම, ඩේලි මිරර් හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකාරතැන (අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011-2661836, 011- 2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081- 2210595/071-4755974/071-8446374/077-7761706.

03-366

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - නාවලපිටිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වික්ටෝරියා රේන්ජ් බංගලෝස් සංකීර්ණයේ නිවාඩු නිකේතනයකට හෝ සංචාරක බංගලාවකට සුදුසු මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාල ප්‍රාදේශීය සභා සීමාව තුළ කෙන්ගල්ල ගමේ පිහිටි අන්ගේතැන්න එස්ටේට් සහ අන්ගේතැන්න නොහොත් අන්කඳුරේවත්ත එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක අයි. විජේකෝන් විසින් 2006.10.28 වැනි දින සාදන ලද අංක 531බී දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 1/166 දරන ඉඩම් කොටස සහ එහි තුළ පිහිටි සියලු පහසුකම් සහිත නිවාස ගොඩනැගිල්ල ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : පර්චස් 16.91

මෙම දේපළ කුසලේන්ද්‍ර රත්නායක යන අය බන්ධනදායි වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.*- මහනුවර නගර මධ්‍යයේ සිට කුණ්ඩසාලේ හරහා දිගන මාර්ගයේ කෙන්ගල්ල කඩවීදිය දක්වා පැමිණ දකුණට හැරී අඹකොටේ පාරට පිවිස මීටර් 800ක් පමණ ගමන් ගෙන දකුණට හැරී වික්ටෝරියා රේන්ජ් නිවාස සංකීර්ණය පාරට පිවිස මීටර් 850ක් පමණ වික්ටෝරියා රේන්ජ් ක්ලබ් පරිශ්‍රය දක්වා ගමන් ගෙන නැවත දකුණට හැරී හමුවන තාර පාර ඔස්සේ මීටර් 100ක් පමණ ගමන් ගත් විට අදාළ දේපළ පිහිටා තිබේ.

2014ක් වූ මාර්තු මස 31 වැනි දින ප.ව. 2.00 ට ආරම්භ වන වෙන්දේසියේ දී මා විසින් විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.11.29 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2013.11.15 වැනි දින ද අයිලන්ඩ්, ලක්බිම හා තිනකුරල් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ :-

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැනුම් මිලෙන් ඉතිරි 90%(සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකරු කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අංක 70 ඒ, ගම්පොල පාර, නාවලපිටිය.

දුරකථන අංක : 054-2223960, 054-2223961-2 ෆැක්ස් : 054-2223963.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක :071-4755974/071-8446374/077-7761706.
දුරකථන/ෆැක්ස් අංකය : 081-2210595.

03-365

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි.

මාරි ඩී ක්ලැසික් ඇටාය(ර්) ප්‍රයිවට් ලිමිටඩ්.
ගිණුම් අංක : 0001 1004 5522 සහ 5999 0000 0684.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010.08.26 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මතකර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හතලිස් ලක්ෂ අසූදෙදහස් අටසිය විසි නමයයි ශත අනූහයක (රු.4,082,829.96) මුදලද, 2010 මාර්තු 03 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසිඑක් ලක්ෂ අසූතුන් දහස් හත්සිය හතලිස් හතයි ශත හතලිස් අටක (රු.2,183,747.48) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි දෙකක් (22%), රුපියල් දෙලක්ෂ අනූ නම දහස් අටසිය තිස්පහයි ශත හැටඑකක (රු. 2,99,835.61) මුදලක් සඳහා වාර්ෂිකව සියයට එකොළහක් (11%), ඇමරිකා එක්සත් ජනපද ඩොලර් අනූපත් දහස් දෙසිය හැත්තෑ හයයි ශත

අනූ පහක (US $. 95,276.95) සමග තවත් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් අසූ හතර දහස් පන්සිය අසූවක ( US $. 84,580) 2010 මාර්තු 03 දින සිට සම්පූර්ණ හිඟ ණය මුදල පියවන දිනය දක්වා වාර්ෂිකව සියයට හයක (6%) ක අවම පොළී අනුපාතයකට යටත්ව ත්‍රෛයිමාසිකව (03) ලන්ඩන් ඉන්ටර් බැන්ක් ලබා දෙන පොළී අනුපාතය වාර්ෂිකව සියයට දෙකයි දශම පහක් (2.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2010.10.29 දින රජයේ ගැසට් පත්‍රයේ, 2010.10.26 දින "දිවයින", සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍ර වල පළකොට ඇති පරිදි 2014.04.01 දින පෙ.ව. 11.30 ට හෝමාගම, ගලවිලවත්ත, සමන් මාවත, 1 වන පටුමග, වරිපනම් අංක 12/1 හි සහ පෙ.ව. 11.45 ට හෝමාගම, ගලවිලවත්ත, සමන් මාවත, 1 වන පටුමග, වරිපනම් අංක 13/1 හිදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනුලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### පළමු උපලේඛනය

පළමුව :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවත් තුළ හෝමාගම පිහිටි ගලවිලවත්ත සමන් මාවත, වරිපනම් අංක 5/7, "ගලවිලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වී. ඒ. එල්. සේනාරත්න යන අය විසින් සාදන ලද 1964 මාර්තු 16 දාතම හා අංක 2898 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 42 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට ලොට් සී (අඩි 20 පළල පාර සඳහා වෙන් කිරීම) නැගෙනහිරට, ලොට් 41 දකුණට : ලොට් 23 සහ බස්නාහිරට : ලොට් 01 (අඩි 12 ක් පළල පාර සඳහා වෙන් කිරීම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අක්. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන්ද සමග එකී අංක. 2898 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G369/67 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

දෙවනුව : බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවත් තුළ හෝමාගම පිහිටි ගලවිලවත්ත සමන් මාවත, වරිපනම් අංකයන් 1/12, 1 වන පටුමග, 5/7, 2 වන පටුමග දරන "ගලවිලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. හෙට්ටිගේ යන අය විසින් සාදන ලද 1993 අගෝස්තු 07 දාතම හා අංක 1549 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ගලවිලවත්ත 2 වන පටුමග (අංක 2898 දරන පිඹුරේ ලොට් සී) නැගෙනහිරට : අංක 2898 දරන පිඹුරේ ලොට් 41 සහ 24 දකුණට : ගලවිලවත්ත 1 වන පටුමග (අංක 2898 දරන පිඹුරේ ලොට් බී ) සහ බස්නාහිරට : අඩි 12 පළල පාර (අංක 2898 දරන පිඹුරේ ලොට් 01) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන්ද, සමග එකී අංක. 1549 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G1472/164 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවත් තුළ හෝමාගම පිහිටි ගලවිලවත්ත සමන් මාවතින් හැරී, 1 වන පටුමග වරිපනම් අංක 1/13 දරන "ගලවිල එස්ටේට් නොහොත් ගලවිලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. හෙට්ටිගේ යන අය විසින් සාදන ලද 1999 ජූනි 26 දාතම හා අංක 2608 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : බලයලත් මානක තැන අයි. කේ. ද එස්. ජයරත්න විසින් සාදන ලද 1995 මැයි 06 දාතම හා අංක 9520 දරන පිඹුරේ ලොට් 02 (අංක 2898 දරන පිඹුරේ මුල් වශයෙන් කොටස ලොට් 41 නැගෙනහිරට : සමන් මාවතින් හැරී, 1 වන පටුමග, අංක 1/4 දරන පරිශ්‍රයන් (අංක. 2898 දරන පිඹුරේ ලොට් 25) දකුණට : සමන් මාවතින් හැරී 1 වන පටුමග (අංක 2898 දරන පිඹුරේ ලොට් 18) සහ බස්නාහිරට : සමන් මාවතින් හැරී 1 වන පටුමග, අංක 1/2 දරන පරිශ්‍රයන් (අංක 2898 දරන පිඹුරේ ලොට් 23) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0, රූ, 0, පර්. 20) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 2608 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G 1472/163 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

03-340/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.